# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1780/15 - 2012 ඔක්තෝබර් 16 වැනි අඟහරුවාදා - 2012.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය :-4624.
විශේෂ අංකය :- කො/1941.

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

කොළඹ 03 හි 8/7, බගතලේ ටෙරස් හි පදිංචිව සිටි දොන් සලමන් කොතලාවල මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම්වලින් ඔහුට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් මේ වන විට ඔහු මියගොස් ඇති බැවින් ඔහුගේ බූදලයට ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2012 ජූනි මස 29 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ, අංක සී 82 හි,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1. නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, වැන්තරුමුලෙයි ගමෙහි පිහිටි සර්වෙයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු මඩ 579 හි දැක්වෙන රොක්වුඩ් වත්ත නැමැති ඉඩම අක්කර 04 රූඩ් 0 පර්. 23 ප්‍රමාණය ඇති කැබලි අංක 01 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද,

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, තිරගන්දහයේ නැගෙනහිර කෝරලයේ සුළු කොට්ඨාසයේ දොරටියාව ගමෙහි පිහිටි සර්වෙයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු කු 677 හි දැක්වෙන දොරටියාව වත්ත නැමැති ඉඩමේ අක්කර 44 රූඩ් 0 පර්. 38 ප්‍රමාණය ඇති කැබලි අංක 01 හා 2 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද,

3. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, හංවැල්ල ගමෙහි පිහිටි සර්වෙයර් ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 80 අතිරේක අංක 23 දැක්වෙන පට්ටිය කුඹුර හා කිතුල කුඹුර හෙවත් නිටොල කුඹුරෙන් නොබෙදූ අක්කර 01 රූඩ් 0 පර්. 26 ප්‍රමාණය ඇති ලොට් අංක 137, 138 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද, වේ.

11-104